**ශීර්ෂය 229 නීතිපති දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 229 **-** නීතිපති දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 15 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට  නීතිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්**,** වියදම්**,** වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුව තිබුණත්, එම අවශ්‍යතාවයන්ගෙන් බැහැර වූ අවස්ථාවක් පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.5 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය, අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය සහ වසර අවසානයේ අග්‍රිම ශේෂයේ එකතුවට සමාන විය යුතු වුව ද, මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට රු.4,149 ක් වූ අග්‍රිම ශේෂය දක්වා නොතිබූ අතර, 2022 දෙසැම්බර් 31 දිනට ඒසීඒ - 3 හි භාණ්ඩාගාර පොත් අනුව තිබුණු ඉහත ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ එය මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වත්කම් යටතේ ද, අග්‍රිම ශේෂය ලෙස ජංගම වගකීම් යටතේ දක්වා නොතිබුණි . | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය දෙපාර්තමේන්තු පොත්වලට අනුව අගය ශූන්‍ය වී ඇති නිසා ශේෂයක් දක්වා නොතිබූ නමුත් භාණ්ඩාගාර පොත්වලට අනුව දෙසැම්බර් 31 දිනට රු.4,149 ක් වූ අග්‍රිම ශේෂය විගණනයේ පෙන්වා දී ඇති පරිදි ඉදිරියේදී ගැලපීමට කටයුතු කරන බවත්, එම ශේෂය මාර්ගස්ථ මුදල් ලෙස මූල්‍ය වත්කම් යටතේ ද අග්‍රිම ශේෂය ලෙස ජංගම වගකීම් යටතේ ද දක්වා නොතිබූ නිසා සිදු වූ වරද 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට සටහන් කරගත් බවද දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු අතර අග්‍රිම ශේෂය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ නිවැරදිව දැක්විය යුතු වේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

දෙපාර්තමේන්තුවට අදාළ ආදායම් ලැබීම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ ඇස්තමේන්තුව අනුව මූලික ආදායම් ඇස්තමේන්තුව රු.62,000,000 ක් වුව ද, මූල්‍ය ප්‍රකාශනයෙහි ඒසීඒ (i) හා ඒසීඒ (ii) ප්‍රකාශයේ රු.65,000,000 ක් ලෙස එම වටිනාකම රු.3,000,000 ක් වැඩියෙන් දක්වා තිබුණි. ඒ අනුව ඒසීඒ (ii) ප්‍රකාශයේ මූලික හා සංශෝධිත ඇස්තමේන්තු අතර වෙනස මූලික ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස හා වෙනසට හේතු දක්වා නොතිබුණි. | අතපසුවීමකින් මූලික ආදායම් ඇස්තමේන්තුව රු. මිලියන 65 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් කර තිබුණ ද, භාණ්ඩාගාරය විසින් මූලික ආදායම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 62 ක් ලෙසත් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 65 ක් ලෙසත් අයවැය ඇස්තමේන්තුවෙහි සඳහන් කර ඇති බව දන්වා තිබුණි. | ආදායම් ඇස්තමේන්තුව නිවැරදිව මූල්‍ය ප්‍රකාශනය තුළ ඇතුළත් කළ යුතු වේ. |

**(ආ)පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්විය යුතු මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් රු.10,499,468 ක් ද, හැකියා වර්ධනය සඳහා වියදම වූ රු.5,269,137 ක් ද ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දැක්වීම හේතුවෙන් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් හා හැකියා වර්ධනය සඳහා පිළිවෙලින් දරන ලද රු.10,499,468 හා රු.5,269,137 ක මුදල ප්‍රාග්ධන වියදමක් වන බැවින් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදමක් සේ නොසලකා භෞතික වත්කම් ඉදිකිරීම හා මිලදීගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම් යටතේ දක්වා ඇති බව දන්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ නිවැරදි දත්ත ඇතුළත් කල යුතු වේ. |

**(ඇ) මූලධන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයේ භෞතික වත්කම් ඉදිකිරීම හා මිලදීගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීම් වටිනාකම රු.128,100,164 ක් වුව ද, රු.143,868,769 ක් ලෙස රු. 15,768,605 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් හා හැකියා වර්ධනය සඳහා දරන ලද වියදම්වල එකතුව වන රු.15,768,605 ක මුදල ප්‍රාග්ධන වියදමක් වන බැවින් භෞතික වත්කම් ඉදිකිරීම හා මිලදීගැනීම හා වෙනත් ආයෝජන අත්පත් කරගැනීමක් සේ සලකා එය තුළට ඇතුළත් කර ඇති බව දන්වා තිබුණි. | ශේෂ පත්‍රයේ වත්කම් වැඩිදියුණුවීම් යටතේ දැක්වෙන අගය පමණක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතුවේ. |

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 506 (ඩී) ප්‍රකාර වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ වර්ෂය අවසානයේ තථ්‍ය අගයන් මුදලින් (11) හා හරස් සටහන් (12) යටතේ වෙන වෙන ම දක්වා නොතිබුණි. | අතපසුවීමකින් සිදුව ඇති අදාළ දෝෂය ඉදිරි ගිණුම් සකස්කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | සැසඳුම් ප්‍රකාශයේ වර්ෂ අවසාන ශේෂයන් 11 හා 12 යටතේ වෙන වෙනම දැක්විය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | වසර 04 කට වැඩි කාලයක සිට හිඟව පවතින සේවය හැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,356,837 ක ණය ශේෂය, 2022 ජනවාරි 17 දින සිට සේවය හැර ගිය නිලධාරියකුගේ රු.113,509 ක ශේෂය සහ වසර 05 කට වැඩි කාලයක සිට හිඟව පවතින වැඩ තහනම් කළ නිලධාරීන් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 168,560 ක ශේෂයන් සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වෙනි පරිච්ඡේදයේ 4.5 හා 6.3 වගන්ති ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | සේවය හැර ගිය නිලධාරීන්ගෙන් රු.743,315 ක මුදලක් මේ වන විට අයකර ගෙන ඇති අතර තවදුරටත් පවතින රු.613,522 ක මුදලක් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බවත්, රු.113,509 ක ණය මුදල ඔහු විසින් පැමිණ ගෙවීම් සිදු කිරීමට පොරොන්දු වී ඇති බවද, වැඩ තහනම් කළ නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බවද, දන්වා තිබුණි. | පැරණි ණයශේෂ අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (iii) | රු. 113,509 ක් වූ සේවය හැර ගිය නිලධාරියාගේ ණය ශේෂය සැසඳුම් ප්‍රකාශයේ 3.7 හි සේවය අත්හැර ගොස් ඇති නිලධාරීන්ගේ ශේෂ යටතේ දැක්විය යුතු වුවද, ඇමුණුම් 3.1 හි දැක්වෙන දෙපාර්තමේන්තුවේසේවයේ නියුක්ත අයගෙන් අයවිය යුතු ණයශේෂ යටතේ දක්වා තිබුණු අතර, සේවය අත්හැර ගිය නිලධාරීන්ගේ ලේඛනයට ඇතුළත් කරනු වෙනුවට දැනට සේවයේ නියුතු නිලධාරීන්ගේ ණය ලේඛනයට ඇතුළත් කර තිබුණි. | ගෙවීම් කිරීමට පොරොන්දු වී ඇති බව දන්වා සිටි බැවින් එම වර්ෂය තුළ ඇමුණුම 3.1 යටතේ එම නිලධාරියාගේ නම ඇතුළත් කොට තිබුණ බවත්, මෙම වර්ෂයේ දී නිලධාරියාගේ නම සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ලේඛනයට ඇතුළත් කිරීමට විෂය ලිපිකරුට උපදෙස් දුන් බවත් දන්වා තිබුණි. | සැසඳුම් ප්‍රකාශයේ ණයශේෂ නිවැරදිව වර්ගීකරණය කළ යුතු අතර ණයශේෂ නිවැරදිව අදාළ ලේඛනවල සටහන් කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 128 (2) (ඉ) ප්‍රකාරව රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරීන් විසින් රජයට ලැබිය යුතුව තිබෙන හිඟ ආදායම් අප්‍රමාදව අයකරගැනීම සම්බන්ධව විශේෂ විධිවිධාන යෙදිය යුතු වුවත්, 2022 දෙසැම්බර් 31 දින | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර වර්ෂ 10 කට වැඩි කාලයක් ඉක්ම වූ ණය සම්බන්ධයෙන් ඒ ඒ ආයතනවල නඩු සම්බන්ධ වාර්තා අස්ථානගත වීම හා වෙනත් විවිධ හේතු මත ගෙවීමට බාධා ඇති බව ආයතන | මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | වන විට සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වෙතින් ලැබෙන නෛතික ගාස්තුවලින් අයවිය යුතු හිඟ ආදායම රු.302,922,679 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ගගෙන නොතිබුණි. එම හිඟ ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි රු.96,208,409 ක් ද, 07 සිට 09 දක්වා රු. 43,473,332 ක් ද, වර්ෂ 04 සිට 06 දක්වා රු.31,524,915 ක් ද, වර්ෂය 01 සිට 03 දක්වා රු.68,037,112 ක් ද, ඇතුළත් ව තිබුණි. | බොහෝමයක් වාර්තාකර ඇතිබව දන්වා තිබුණි.<br><br>කවර හේතු පැවතියත් ණයශේෂ අයකර ගැනීම සඳහා ගත හැකි සෑම ක්‍රියාමාර්ගයක්ම ගෙන ඇති අතර ඉදිරියටත් එම ක්‍රියාමාර්ග ප්‍රබල ලෙස ඉටු කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ඉකුත් වර්ෂයට අදාළ සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල වෙතින් ලැබෙන නෛතික ගාස්තුවලින් අයවිය යුතු හිඟ ආදායම රු.46,154,860 ක් වූ අතර ඉකුත් වර්ෂයට පෙර වර්ෂවලට අදාළ හිඟ ආදායම රු.263,901,925 ක් විය. ඉන් සමාලෝචිත වර්ෂයේ අයකිරීම් පිළිවෙලින් රු.21,508,160 ක් හා රු.48,710,797 ක් වූ අතර එය සියයට 46 ක් හා සියයට 18 ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබුණු අතර 2005 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 16 ත් 18 ත් අතර කාලයක් අඛණ්ඩව ආයතන 13 කින් රු.178,151,672 ක හිඟ ආදායමක් අයකරගෙන නොතිබුණි. | 2020 වර්ෂයේ සිට පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය නිසා ණයශේෂ පියවීම 2022 වර්ෂයේ මැද භාගය වන තෙක් ක්‍රමයෙන් අඩුවීමක් සිදු වී ඇත. කෙසේ වෙතත් මේ වන විට මෙම තත්වය මඟ හැරෙමින් පවතින අතර අදාළ වර්ෂයේ සහ ආසන්න වර්ෂවල ණයශේෂ පියවීමට කටයුතු කරමින් පවතින බවත්, 2023 මැයි 10 දින ආයතන 13 හි ආයතන ප්‍රධානීන් කැඳවා හිඟ ණයශේෂ කඩිනමින් පියවීමට කටයුතු කරන ලෙස උපදෙස් ලබා දුන් බවද, දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ ආදායම් අප්‍රමාදව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | මුදල් රෙගුලාසි 175(2) ප්‍රකාරව හිඟ මුදල් සම්බන්ධයෙන් අප්‍රමාදව නීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, නීති මාර්ගයෙන් හෝ හිඟ මුදල් අයකරගත නොහැකි නම් දීර්ඝකාලීන හිඟ මුදල් භාණ්ඩාගාරයේ එකඟතාවය මත කපා හැරීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වුවත්, 2005 සිට 2009 දක්වා වර්ෂවල සිට දීර්ඝ කාලීනව ආයතන 24 කින් රු.936,420 ක ආදායමක් අයවීමට පැවතුණි. | 2005 සිට 2009 වර්ෂය දක්වා හිඟ මුදල් ඇති බොහෝ ආයතනවල නඩුවලට අදාළ තොරතුරු සොයාගත නොහැකි බැවින් ගෙවීම් කටයුතු කිරීමට අපහසු බව දිගින් දිගටම දන්වා ඇත. ඒ අනුව 2005 සිට 2009 දක්වා වර්ෂ වලට අදාළ හිඟ ශේෂ ගෙවීම අපහසු වීමට අදාළ තොරතුරු ගෙන්වා ගැනීමටත් ඉන් අනතුරුව එම ණයශේෂ කපා හැරීම සඳහා භාණ්ඩාගාරයට දන්වා අවශ්‍ය කටයුතු කිරීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව හිඟ මුදල් අයකර ගැනීමට නීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 3 (xvii) ඡේදය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් ඒවා වර්ෂය අවසානවීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුවත්, පුනරාවර්තන වැය විෂයයන් 04 ක රු.50,900,000 ක් වූ ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් වෙනත් වැය විෂයයන් සඳහා මාරුකර තිබුණි. | රට තුළ ඇති වූ මූල්‍ය අර්බුදය හේතුවෙන් වර්ෂය තුළ සියලු භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහල යාම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් කිහිපයක් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ අතර, අදාළ වැය විෂයයන් 04 හි වියදම් කළමනාකරණය කරගනිමින් ඉතිරි කර ගත් ප්‍රතිපාදන මුදල් රෙගුලාසි 66 මගින් ප්‍රතිපාදන හිඟ වූ වැය විෂයයන් වලට මාරුකර ගනු ලැබූ බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රතිපාදන උපයෝජනය කල යුතු වේ. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 13 දිනැති අංක 2022/05 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය අනුව ආයතනයේ බැඳීම් හා වගකීම් 2022 දෙසැම්බර් 31 දිනට බැඳීම් අංක අනුව හෙළිදරව් කළ යුතු වුවත්, භාණ්ඩාගාරයේ SA 92 දරන සමුච්චිත බැරකම් වාර්තාවේ, බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ (ඇමුණුම iii) යටතේ සහ බැරකම් ලේඛනයේ රු.4,168,426 ක බැරකම් ඇතුළත් කර නොතිබුණි. | විගණකාධිපති සම්පිණ්ඩන වාර්තා කෙටුම්පතෙහි සඳහන් පෙර වර්ෂයේ ගෙවීම් වලට අදාළ ජල, විදුලි හා දුරකථන බිල්පත් ප්‍රමාද වී (2023 වර්ෂයේදී) ලැබීම හේතුවෙන් බැරකම් ලේඛනයට ඇතුළත් කළ නොහැකි වූ බව දන්වා තිබුණි. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව බැරකම් නිවැරදිව හෙළිදරව් කළ යුතු වේ. |

## 2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන | විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති අතපසුවීම් හා අඩුපාඩු සම්බන්ධයෙන් සමාලෝචනය කර බලා විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වැරදි හා අඩුපාඩු ඉදිරි වර්ෂයේදී ඇති නොවන ආකාරයට කටයුතු කරන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ii) | වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථීත්‍යයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.2 ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණය හේතුවෙන් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති අතපසුවීම් හා අඩුපාඩු සම්බන්ධයෙන් සමාලෝචනය කර බලා විගණනයෙන් පෙන්වා දී ඇති පරිදි වැරදි හා අඩුපාඩු ඉදිරි වර්ෂයේදී ඇති නොවන ආකාරයට කටයුතු කරන බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>177 (1) | 3,466,492 | දෛනිකව රැස්කර තිබූ ආදායම මුදල් රෙගුලාසි ප්‍රකාරව කාල පමාවකින් තොරව රජයේ ආදායමට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | සිදුවන ප්‍රමාදයන් වළක්වා ගනිමින් මේ වන විට දෛනිකව රැස් කරනු ලබන ආදායම කාල ප්‍රමාදයකින් තොරව රජයේ ආදායමට ගිණුම්ගත කිරීම කරගෙන යනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| 446 (ඇ) | 3,339,243 | මුදල් රෙගුලාසි ප්‍රකාරව දෙපාර්තමේන්තු ලැබීම් සඳහා රිසිට්පත නිකුත්කළ විගස මුදල් පොතට එම ලැබීම් ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | සිදුවන ප්‍රමාදයන් වළක්වා ගනිමින් මේ වන විට දෛනිකව හරි වැරදි බලා සැසඳුම් අවසන් කර මුදල් පොතට ඇතුළත් කිරීම කරගෙන යනු ලබන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කාල ප්‍රමාදයකින් තොරව ලැබීම් මුදල් පොතට ඇතුළත් කළ යුතු වේ. |
| 891 | | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනය යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇප ලේඛනයෙහි පවතින අඩුපාඩු නිවැරදි කර මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනය පවත්වා ගෙන යාමට කටයුතු කරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලේඛනය පවත්වාගෙන යා යුතු වේ. |

**2.6 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01 / 2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 371 (2) ප්‍රකාරව, අතුරු අග්‍රිමය නිකුත් කිරීමෙන් පසු අදාළ කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිමය පියවිය යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ අත්තිකාරම් ලබාදීම් පරීක්ෂාවේ දී රු.2,484,923 ක් වටිනාකමැති කාල ප්‍රමාදයන් අවස්ථා 64 ක් වූ අතර 2022 වර්ෂයේ අවස්ථා 03 කදී වටිනාකම රු.475,550 ක් වූ රු.100,000 කට වැඩි අත්තිකාරම් ලබා දී තිබුණි. | මේ වන විට කාල ප්‍රමාදයකින් තොරව අදාළ තත්කාර්යය අතුරු අග්‍රිම නිරවුල් කිරීමට කටයුතු කරනු ලබන බවත් දන්වා තිබුණු අතර මේ වන විට තත්කාර්යය අතුරු අග්‍රිම සීමාවන්ට අනුකූලව පමණක් අත්තිකාරම් ලබාදීම සිදු කරන බව දන්වා තිබුණි. | තත්කාර්යය අතුරු අග්‍රිම ලබාදීමේදී හා පියවීමේදී මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ විධිවිධානවලට අනුගතව කටයුතු කල යුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 371(4) පරිදි නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොගත යුතු වුව ද, රු.399,000 ක් වූ අත්තිකාරම් මුදල් මාස 02 දින 14 සිට මාස 08 දින 24 ක කාලයක් අත රඳවාගෙන ආපසු පියවීම කර තිබූ අවස්ථා 05 ක් විය. | දැනට අතුරු අග්‍රිම ලබාදීමේදී අදාළ අඩුපාඩු නිවැරදි කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා නොදිය යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) තත්කාර්යය අතුරු අග්‍රිම ලේඛනය අනුව ඇතැම් නිලධාරින්ගේ තනතුර සඳහන් කර නොතිබීම නිසා එම නිලධාරීන් මාණ්ඩලික තනතුරේ නිලධාරියෙක් ද යන්න විගණනයේ දී තහවුරු කරගත නොහැකි වූ අතර අත්තිකාරම් ලබාගත් කාරණය නිශ්චිතව සඳහන් නොකර අත්තිකාරම් ලබාගෙන ඇති අවස්ථා විය. | දැනට අතුරු අග්‍රිම ලබා දීමේදී අදාළ අඩුපාඩු නිවැරදි කර ඇති බව දන්වා තිබුණි. | තත්කාර්යය අතුරු අග්‍රිම ලේඛනයේ අදාළ තොරතුරු ඇතුළත් කරමින් යාවත්කාලීන කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

බැංකු ගිණුම් මෙහෙයවීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ අඩුපාඩුව පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් ලංකා බැංකුවේ ත්‍රැප්‍රොබේන් ශාඛාවේ ගිණුම් අංක 2026431 දරන (Attorney Genaral Asia Foundation Programme) ගිණුම 2005 වර්ෂයේ සිට අක්‍රියව පවතින අතර 2023 පෙබරවාරි 05 දිනට මෙම ගිණුමේ ශේෂය රු. 3,000 ක් විය. | අවශ්‍ය සියලු විස්තර සහිතව භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල් වෙත අදාළ බැංකු ගිණුම වසා දැමීමට අයදුම්පත් ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | අක්‍රිය බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සෑම වර්ෂයක් සඳහා ම අනුමත ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස්කළ යුතු අතර ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස්කර ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු වුවත්, 2022 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම 2022 පෙබරවාරි 03 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම නියමිත දිනට සකස්කර ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව නියමිත දිනට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඉදිරිපත් කළ යුතු වේ. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ඉහත චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ගත වීමට පෙර හා 2022 මැයි 26 දිනැති අංක PFD/RED/REG/02/CC/2022 දරන මුදල් අමාත්‍යාංශයේ ලිපිය අනුව 2021 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව, දින 150 කට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නොහැකි වූයේ නම් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට 2022 ජූනි 30 දක්වා දින දීර්ඝ කර ඇති නමුත්, 2020, 2021 වර්ෂවල කාර්ය සාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණේ 2022 දෙසැම්බර් 20 දින වන අතර, චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2023 මැයි 12 දින ඉදිරිපත් කර තිබුණි. | සිදු වූ ප්‍රමාද දෝෂයකින් 2020 හා 2021 වර්ෂයන්හි වාර්ෂික කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම ප්‍රමාද වූ අතර ඉදිරියේදී නියමිත දිනට වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත්, ඉදිරි කාර්යසාධන වාර්තාවන් විගණන පනත ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවද දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය සාධන වාර්තාව පාර්ලිමේන්තුවට නියමිත දිනට ඉදිරිපත් කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කළ යුතු වේ. |

### 3.3 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2006 (4) (2) වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්ම සකස්කළ යුතු අතර, එම වගන්තියේ 4.2 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන | 2021 වර්ෂයේ ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දී තිබූ ප්‍රතිපාදන 2020 වර්ෂයේ සිදු කරන ලද මිලදී ගැනීම් වල බිල්පත් පියවීම සඳහා යොදා ගනු ලැබූ අතර විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලැබී නොතිබුණි. එදිනෙදා මෙහෙයුම් කටයුතු සඳහා මූලික | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව හා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| ප්‍රසම්පාදන සැලැස්මට ලැයිස්තුගතකර තිබිය යුතුය. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව සකස් කිරීම හා අංක 02/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස්කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබාගෙන එහි පිටපත් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පමණක් පිළියෙල කරනු ලැබූ බවද, ඉදිරි වර්ෂයන්හිදී නියමිත දිනට ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර විගණනයට ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | |

## 3.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය හා මුදල් රෙගුලාසි අංක 756 (6) ඡේදය ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර අවසන් කිරීමේ කාල රාමුව දක්වා තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ එම කාලරාමුවට සිදු කිරීම, ඉදිරි මුදල් වර්ෂයේ පෙබරවාරි 28 ට පෙර වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත වාර්තා කිරීම හා ක්‍රියාමාර්ග ගැනීම සහ එම වාර්තා විගණකාධිති වෙත යොමු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයන්හිදී භාණ්ඩ සමීක්ෂණයන් අදාළ කාල රාමුව තුළ සිදුකිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බවත්, භාණ්ඩ සමීක්ෂණ වාර්තාව පරිදි ඌනතා හා අතිරික්ත සම්බන්ධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරෙමින් පවතින බව ද, දන්වා තිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය නියමිත කාල රාමුව අනුව සිදු කළ යුතු අතර, නියමිත දිනට ඌනතා හා අතිරික්ත සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

### 3.5 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයට උපරිම වාසියක් ලැබෙන පරිදි ගෙවීම් කිරීම කළ යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් කුලී පදනමට ලබාගෙන තිබූ ගොඩනැගිල්ලක් සහ දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ල සඳහා 2022 ජනවාරි සිට මාර්තු දක්වා විදුලි බිල්පත් ගෙවීමේ දී මාසික විදුලි පාරිභෝජන වියදමට අමතරව එකතුව රු.176,477 ක් වූ දඩ පොළී මුදලක් ද සහිතව විදුලි බිල්පත් සඳහා ගෙවීම් කිරීමෙන් රජයට මූල්‍ය අවාසියක් සිදු වී තිබුණි. | භාණ්ඩාගාරයෙන් අක්මුදල් ඉල්ලුම් කළද, අදාළ අක්මුදල් නියමිත දිනට නොලැබීමෙන් විදුලි බිල්පත් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් පොළී මුදලක් එකතු වන අතර ඉදිරියේදී මෙම තත්ත්වය වලක්වා ගැනීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දන්වා තිබුණි. | විදුලි බිල්පත් ගෙවීමේ දී පොලියක් නොගෙවන ආකාරයට නියමිත දිනට ගෙවීමට කටයුතු කළ යුතු වේ. |

### 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

### 4.1 තිරසර සංවර්ධන වැඩසටහන

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අප්‍රේල් 27 දිනැති අංක එම්එස්ඩීඩබ්/08/65 දරන තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය සඳහා තිරසර සංවර්ධන අරමුණු හා දර්ශක හඳුනාගෙන එම තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සම්බන්ධීකරණය කිරීමට නිලධාරීන් පත්කොට තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කර නොතිබුණි. | හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අරමුණු අතරින් 16 වන අරමුණ වන සාමය, යුක්තිය සහ ශක්තිමත් ආයතන යන අරමුණ ඉටුකර ගැනීම නීතිපති දෙපාර්තමේන්තුව විසින් අපේක්ෂා කරනු ලබයි. ඒ සඳහා දෙපාර්තමේන්තුවේ විවිධ අංශ පිහිටුවා ඇති අතර ළමා අපයෝජන, මහජන පෙත්සම් සඳහා එම අංශයන් මගින් විවිධ ක්‍රියාමාර්ග ගනු ලබයි. ඉදිරියේදී තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය නිකුත් කරන ලද ලිපිය ප්‍රකාරව තිරසර සංවර්ධන වැඩසටහනක් පිළියෙල කළ යුතු වේ. |

## 4.2 පුරවැසි/සේවාලාභි ප්‍රඥප්තිය හඳුන්වා දීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| උක්ත මැයෙන් නිකුත් කර තිබෙන 2008 පෙබරවාරි 06 දිනැති සහ 2018 ජනවාරි 24 දිනැති අංක 05/2008 සහ 05/2008 (i) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය අංශයේ ක්‍රියාකාරකම් වඩාත් කාර්යක්ෂම කිරීමට සහ ඒ සඳහා සම්බන්ධවන්නා වූ පාර්ශවයන් අතර මනා අවබෝධයක් සහ එකිනෙකා අතර විශ්වාසය වැඩි දියුණු කිරීමට පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා දීම සෑම රාජ්‍ය ආයතනයක් විසින් ම සිදුකළ යුතුව තිබුණ ද, එසේ සිදුකර නොතිබුණි. | ඉදිරියේදී අදාළ ප්‍රඥප්තිය හඳුන්වා දෙනු ලබන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි සෘජුවම බලපානු ලබන ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 523 ක් පැවතිය ද 2022 දෙසැම්බර් 31 දිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 223 ක් වීම හේතුවෙන් නිලධාරීන් 300 ක පුරප්පාඩුවක් පැවතුණි. එමෙන්ම තෘතීය හා ද්විතීය මට්ටමේ තනතුරු සඳහා අනුමත නිලධාරීන් සංඛ්‍යාව පිළිවෙලින් 15 ක් හා 359 ක් වුව ද, 2022 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය පිළිවෙලින් 05 ක් හා 156 ක් වීම හේතුවෙන් තෘතීය හා ද්විතීය මට්ටමේ නිලධාරීන් 213 ක පුරප්පාඩුවක් පැවතුණි. තවද, ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 404 ක් වුව ද, 2022 දෙසැම්බර් 31 දිනට සත්‍ය වශයෙන් සිටින කාර්ය මණ්ඩලය 277 ක් වීම හේතුවෙන් නිලධාරීන් | ජාතික අයවැය චක්‍රලේඛ අනුව පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීම් නවත්වා ඇති බැවින්, මේ සඳහා අනුමැතිය ලබා ගැනීමට වරින්වර අධිකරණ අමාත්‍යාංශය මගින් අග්‍රාමාත්‍ය කාර්යාලය දැනුවත් කර ඇති බවද, තෘතීය හා ද්විතීය මට්ටමේ පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් ලබාදෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වරින්වර දැනුවත් කර ඇති බවද, ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පවතින බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කරදෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති බවද දන්වා තිබුණි. | පුරප්පාඩු පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි බලපාන බැවින් හැකි ඉක්මනින් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | 127 ක පුරප්පාඩුවක් පැවතුණි. ඒ අනුව මෙම තනතුරු වර්ගීකරණය යටතේ සිටින කාර්ය මණ්ඩලය ප්‍රතිශතය පිළිවෙලින් 57, 57 හා 31 ක් විය. | | |
| (ආ) | අංක 02/2018 හා 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මේ වර්ෂයේ සිට මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස්කළ යුතු වේ. |